Page 5 September 2008.qxd 18/09/2008 20:18 Page 1





මෙවර ඔලිම්පික් රන් පදක්කම් ලැබූ මහා බ්‍රිතාන්‍යයේ අයගෙන් තිදෙනෙක්. දකුණු කෙළවරේ සිටින ක්‍රිස් හෝයි තනිවම රන් පදක්කම් තුනක් ම දිනුවේ ය.
Three Gold medalists for Britain. **Chris Hoy** - the champion cyclist, on the right, became the most sucessful Olympion, to win **3 Gold Medals**.



# ඔලිම්පික් සඳහා ලක්බිමෙන් රන්ජන්

**ශ්‍රී** ලංකාවේ පළවන **ලක්බිම** පුවත්පතේ ක්‍රීඩා අංශයේ කර්තෘ **රන්ජන් පරණවිතාන** මේ ඡායාරූපය විද්‍යුත් තැපැලෙන් අපට එව්වේ බේජිං නගරයේ සිට ය. ගිය මාසයේ ඔලිම්පික් තරඟ පැවති චීනයේ බේජිං නුවරට ඔහු ගොස් සිටියේ එම උත්සවය **ලක්බිම** පුවත්පතට වාර්තා කරන්නටය. මීට පෙරද ලෝකයේ බොහෝ රටවල පැවති ක්‍රීඩා උළෙලවල් සහ ක්‍රිකට් තරඟා වලි සඳහා ද රන්ජන් සහභාගි වී ඇත.

දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකු වන රන්ජන් කළුතර මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි. ඔහු ක්‍රිකට් පුහුණුකරුවෙකු ලෙසද ක්‍රියා කර ඇත. රන්ජන් සකස් කරන ලක්බිම පත්‍රයේ ක්‍රීඩා පිටුව බොහෝ පාඨකයින්ගේ අවධානයට ලක්වන්නකි. ක්‍රිකට් මෙන්ම මළල ක්‍රීඩා අංශයන් කෙරෙහිද මහත් සැලකිල්ලක් දක්වන ඔහු ශ්‍රීලංකාවේ ක්‍රීඩා නගා සිටුවීමට කැපවී ක්‍රියාකරන්නෙකි.



Britain's Victoria Pendleton won Olympic Gold for cycling

## Looking forward to 2012 London

After the recent Beijing spectacular which was admired around the world, many are in the opinion that China's commitment to 2008 Olympics would be a difficult act to follow by the future hosting countries. Now with that, all eyes of the world are turned to London East End where 2012 Summer Olympic festival is scheduled to begin.

It is estimated that the cost would be nearly £18 bn for the infrastructure and security to run the Olympics, yet the authorities admit their turn to host will not be as extravagant as Beijing. Britain has nothing to feel badly about; this year's Olympics were the most expensive in history, and it's unlikely another city would top that.

Britain is in the midst of a credit crunch that didn't exist when they won the Olympic sweepstakes three years ago. The government has already expanded their original budget by $13 billion, and says the current $17.4 billion budget is all they can afford.

Unfortunately, there's no guarantee the expense will pay off - a Merill Lynch study showed that of the last 11 Olympics, the Games caused financial problems for 10 of the host cities.

However the Olympic Comitte in the UK believe their objectives could be met.

**Those objectives are:**

1. Making the UK a world-leading sporting nation.
2. Transforming the heart of east London.
3. Inspiring a new generation of young people to take part in volunteering, cultural and physical activity;
4. Making the Olympic Park a blueprint for sustainable living.
5. Demonstrating the UK is a creative, inclusive and welcoming place to live in, visit and for business.

## චීනය ඔලිම්පික් වලට සූදානම් වුනේ මෙහෙමයි

**හෝ**දට බඩ පිරෙන්න බත් කා, වරුවක් හාන්සි පුටුවක ඇලවී සිට, කම්මැලි කඩමින් ගොස් ඔලිම්පික් දිනන්නට බැරිය. ඔලිම්පික් තබා කොයි කෙහෙල් මලක්වත් කරන්නට බැරිය. පසුගිය මාසයේ අවසන් වූ චීනයේ බේජිං නගර යේ වූ ඔලිම්පික් තරඟ වලදී බොහෝ රටවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් රන්, රිදී හා ලෝකඩ පදක්කම් දිනාගත්තේ ඉතා කැපවීමෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව ඒ තමන් නිරත වූ තරඟවලට දීර්ඝ කාලයක් පුහුණුවීමෙනි.

චීනයේ ජිම්නාස්ටික් කණ්ඩායම මේ වර ඔලිම්පික් තරඟවලදී මුල්වරට රන් පදක්කම් දිනුවා ය. ඔවුන් ඉදිරි කාලවලදී තවත් පදක්කම් දිනනවා ඇත යන්න ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍යය දුටු කාගේත් මතය වීය. එහෙත් මේ පිටුපස නැගෙන චෝදනාවලින් ද චීනයට බේරී සිටිය නොහැකි ය. මේ හැම දෙයක් පිටු-පස කිසියම් දුක්ඛ සහගත සිදුවීමක් ද ඇති බව දැන් පෙනීයයි. ඒවා චීනයට මඩ ගසන්නට ගෙතූ ප්‍රබන්ධ ලෙසින් සලකා ඉවත දැමිය හැකි ද නොවේ. මේ සමග දකුණු පස ඇති පින්තූරවලින් අපට පෙනී යන්නේ ද ඒ කරුණම ය.

ජිම්නාස්ටික් කණ්ඩායමට තෝරා ගන්නා ගැහැණු ළමයි චීනයේ ඉතා ඈත පළාත්වලින් වයස අවුරු හය හත තරම් කුඩා අවධියේ කැටුව ආ අයයි. ඔවුන්ට දවසකට පැය ගණනක් දිගටම පුහුණුව දෙන අතර දෙමාපියන් බලන්නට ගෙදර යා හැක්කේ අවුරුද්දකට වරක් පමණි. පිටස්තර අය සමග හෝ විශේෂයෙන් පත්තර වාර්තාකරුවන් හා කතාකිරීම තහනම් ය. එසේ කතාකරනවා නම් පුහුණුකරන ගුරුවරයා හෝ ගුරුවරිය ද ළඟ සිටිය යුතු ය. පුහුණුකරන අයට එරෙහිනොවී හැම විටම විනයගරුකව සිටීම අපේක්ෂා කෙරේ.

බාල වයස්කාර ළමයි දැඩි වෙහෙස කාරී ශාරීරික අභ්‍යාසයන්හි යෙදවීම තහනම් කෙරෙන නීතියක් ඔලිම්පික් තරඟ සඳහා ඇත. මෙවර තරඟ වල සහභාගි වූ ඇතැම් චීන ගැහැණු ළමයින් ගේ හැඳිනුම්පත් වල වයස මාරු කළ බවට චීනයට චෝදනාවක් ද නැගී ඇත.



මොකද මූණ බෙරිවෙලා? ජිම්නාස්ටික් ඉතින් මෙහෙම තමයි.....







Flying to Sri Lanka? Speak to us first...

Exclusive to Holiday Air!
December seat sale to Colombo

ROYAL JORDANIAN £415 + tax*

Traveling out of London: 11th Dec, 16th Dec & 23rd Dec
Returning to London - 1st week in Jan
Limited seats available
Hurry, book now to avoid disappointment.

SriLankan £420 + tax**
KUWAIT AIRWAYS £355 + tax**
QATAR AIRWAYS £336 + tax**

MCG 020 8882 2626
IATA www.holidayair.com
125-127 Bramley Road, Oakwood, London, N14 4UT